**<u>කොළඹ ක්‍රියාදාමයේ අමාත්‍ය මට්ටම් 5 වැනි රැස්වීමේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රී, විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා කළ ප්‍රකාශය</u>**

**2016 අගෝස්තු 25, කොළඹ, ශ්‍රී ලංකාව**

සභාපතිනි, විදේශ රැකියා අමතිනි ගරු තලතා අතුකෝරළ මැතිණියනි,
සංක්‍රමණිකයන් සඳහා ජාත්‍යන්තර සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් විලියම් ස්වින්ග් මැතිතුමනි,
කොළඹ ක්‍රියාදාමයේ අමාත්‍ය මට්ටමේ 5 වැනි රැස්වීමට පැමැණි ගරු ඇමතිවරුනි,
උතුමාණෙනි, සම්භාවනීය නියෝජිතවරුනි, මිත්‍රවරුනි,

කොළඹ ක්‍රියාදාමයේ (Colombo Process ) අමාත්‍ය මට්ටමේ 5 වැනි රැස්වීමේ සමාරම්භක උත්සවයේදී මෙම උදෑසන ඔබ සමග එක්වීමට ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටට පත් වෙමි. 2003 වසරේ කොළඹදී ආරම්භ කරන ලද මෙම සංසදය, ගිවිසුම්වලට අනුව සේවය කරන ආසියානු ශ්‍රමික සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් හා සුභ සාධනය ප්‍රවර්ධනය කරමින් සිටියි. කොළඹ ක්‍රියාවලිය අපගේ සංක්‍රමණික සේවකයින් මුහුණ දෙන අභියෝග සාමූහිකව ජය ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන ස්වේච්ඡා සංසදයක් වෙයි. එහි සාමාජිකයන් සංඛ්‍යාව 11 කි. මෙම කලාපීය උපදේශාත්මක ක්‍රියාවලිය තුළ පසුගිය වසර 13 මුළුල්ලේ ඇතිරගෙන ඇති විශිෂ්ඨ ප්‍රගතිය මගින් අප සහයෝගීතාව සහ සාමූහික ප්‍රයත්න ප්‍රදර්ශනය කරයි.

ශ්‍රී ලංකාවට සපැමිණි සංක්‍රමණිකයන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් තානාපති විලියම් ස්වින්ග් මැතිතුමා උණුසුම් ලෙස පිළිගනිමි. එතුමාගේ සංවිධානය සංක්‍රමණිකයින්ගේ සුභ සාධනය සහ ආරක්ෂාව සඳහා ඇප කැප වෙමින් එය වසර 65 ක් මුළුල්ලේ ඉටු කළ සේවාව වෙනුවෙන් මගේ සුභ පැතුම් පිරිනැමීමට මෙය අවස්ථාවක් කොට ගනිමි. සංක්‍රමණිකයින් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානය හා සම්බන්ධ ආයතනයක් ලෙස නොබෝදා ඇතුළත් කර ගැනීම පිළිබඳව සුභාශිංෂණය පිරිනමමි. සංක්‍රමණික කටයුතු සඳහා පහසුකම් සැළසීමේදී, විශේෂයෙන් කොළඹ ක්‍රියාදාමයේ සාමාජික රටවලට එය සහය ලබා දීමේදී, එම සංවිධානයේ කාර්ය භාරය මෙහිදී ප්‍රශංසාවට ලක් කළ යුතුය.

සම්භාවනීය අමුත්තනි,

සංක්‍රමණය සම්බන්ධයෙන් වර්තමානයේ පවතින ගෝලීය ප්‍රවණතා හා සංකීර්ණ තත්වයන් සැළකිල්ලට ගැනීමේදී අපට ඇති අභියෝගවලට එක් රටකට විසඳුම් සෙවිය නොහැකිය. සෑම සංක්‍රමණ ප්‍රශ්නයක් සඳහාම එකම පිළිතුරක් මගින් ඒවා විසදිය නොහැක. අන්තර් සබඳතා ගොඩනැගී ඇති ලෝකයක ජාත්‍යන්තර සංක්‍රමණ තත්කාලීන යථාර්තයකි. ඒ සඳහා විශිෂ්ඨ කළමනාකරණ විසඳුම් අවශ්‍ය වෙයි. ලොව පුරා මානව සංචරණයන් ප්‍රමාණය වැඩිවත්ම සංක්‍රමණ කටයුතු සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් රටවල් ඇතුළු සෑම රටකම අවධානය යොමුවී ඇත. සරණාගතයන් හා සංක්‍රමණික පිරිස් වල සංචරණයන් ප්‍රමාණය ඉහළ යෑම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ ඉහළ මට්ටමේ රැස්වීම ඊළග මාසයේ නිව්යෝර්ක් හි පැවැත්වීමට නියමිතය. 2018 වසර වන විට ආරක්ෂාකාරී ලෙස හා ක්‍රමානුකූල ලෙස සංක්‍රමණ කටයුතු සිදු කිරීම සඳහා ගෝලීය ගිවිසුමක් සකස් කිරීමේ ක්‍රියාවලියක් සැළසුම් කිරීමට එහිදී සාමාජික රටවල් විසින් කටයුතු කරනු ඇත. අදාළ ජාත්‍යන්තර නෛතික රාමු තුළ කටයුතු කරමින් ඵලදායි ප්‍රතිඵල ළගා කර ගැනීම සඳහා වන මෙම බහු පාර්ශ්වික ප්‍රයත්නයන්ට ශ්‍රී ලංකාව සිය පූර්ණ සහය ලබා දෙයි.

සම්භාවනීය අමුත්තනි,

කොළඹ ක්‍රියාදාමයේදී ඔබ දක්වන සාමූහික ප්‍රයත්නයන් හා විශේෂයෙන්ම ශ්‍රී ලංකාව සභාපතීත්වය දැරූ කාලයේදී මූලික ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැංවීමෙහිලා ගත් ප්‍රයත්නයන් ඇගයීමට ලක් කරමි. මෙම කාර්ය මූලික මාර්ග සිතියම මගින් කොන්ත්‍රාත් ශ්‍රමික සංක්‍රමණික කර්මාන්තය කෙරෙහි වැදගත් වන ' සංක්‍රමණික සේවකයන්ගේ කුසලතාහදුනාගැනීමට' මෙන්ම 'බඳවාගැනීමේ කර්මාන්තයට ආචාර ධර්ම, ප්‍රතිමාන සහ ප්‍රාථමික හදුන්වාදීමට' අදාළ ගැටළුවලට විසදුම් ලබා දෙනු ඇත. එමෙන්ම  ලාභදායී, සුපරික්ෂාකාරී, වේගවත් මුදල් සම්ප්‍රේෂණ මාර්ග වැඩි දියුණු කිරීමටද කොළඹ ක්‍රියාදාමය උත්සහ දරයි. සංක්‍රමණ සේවකයින්ට සිය මුදල් ප්‍රේෂණ කටයුතු වලදී දැරිය යුතු වන සම්ප්‍රේෂණ පිරිවැය 3% ට වඩා අඩු කිරීමේ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කය ළගා කර ගැනීමෙහිලා මෙම ප්‍රයත්නයන් උපකාරී වනු ඇත. තවද අපගේ සංක්‍රමණ සේවකයන් මෙරටින් පිටවීමට පෙර අපි ඔවුන්ට ඒ පිළිබද හදුන්වාදීමක් සිදු කරන්නේ හා ඔවුන් පුහුණු කරන්නේ කෙසේද යන්න ඔවුන්ට රැකියාවේදී ඇතිවිය හැකි අපේක්ෂා භංගත්වය හා තැවුල් වළක්වාලීම සඳහා අත්‍යාවශ්‍ය වූ සාධකයකි. මෙම සංසදයේ ශ්‍රම වෙළඳපොළ පිළිබදව පර්යේෂණ සිදු කිරීම හා තොරතුරු හුවමාරු කර ගැනීම හා සම්බන්ධයෙන් වූ න්‍යාය පත්‍රය මහත් වැදගත්කමින් යුතු වූවක් බව පෙනී යයි. මෙම ප්‍රමුඛතා ක්ෂේත්‍රවලට අදාළව සමීප සබඳතා අඛණ්ඩව පවත්වා ගෙන යන මෙන් ඔබ සැම දිරිමත් කරමි.

සම්භාවනීය අමුත්තනි,

කොළඹ ක්‍රියාදාමය සහ අබුඩාබි සංවාදය ( ADD ) අතර ඉදිරියට ක්‍රියාත්මක අන්තර් සම්බන්ධතා ඉතා වැදගත් නව මූලිකාංග ගෙන ඒමට සමත් විය. මෙම අන්‍යෝන්‍ය සම්බන්ධතා හරහා කම්කරු ශ්‍රමය අපනයනය කරන හා ආනයනය කරන රටවල් යන දෙවර්ගයටම තම කාර්යන්හි සාර්ථක ඉදිරි ගමනක් බලාපොරොත්තු විය හැකිය. ලබන වසරේ පවත්වන අබුඩාබි සංවාදයේ සභාපතීත්වය ශ්‍රී ලංකාව උසුලන අතර එහිදී, සංක්‍රමණික ගැටලු පිළිබද තව දුරටත් අවධානය යොමු කිරීමේ අටියෙන් වෙනම ලේකම් කාර්යාලයක් සහ ආයතනික යාන්ත්‍රණයක් සමුළුව වෙත ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.

සම්භාවනීය අමුත්තනි,

බොහෝවිට පීඩා සහගත තත්වයන් හමුවේ, විදේශ වල සේවය කරන පුද්ගලයින් දැඩි වෙහෙසක් දරා උපයන මුදල් අපගේ බොහෝ රටවල පවතින සමාජ විෂමතා අවම කිරීමෙහි ලා මහගු දායකත්වයක් ලබා දෙන බව අපි දනිමු. මාගේ මව් රටේද තත්වය එසේ වන අතර. වෙහෙසවී සේවය කරන මෙම පුරවැසියන් රටේ ආර්ථිකයට ප්‍රබල සහයක් ලබා දෙයි. එම ජනතාව අප රටෙහි සේවා නියුක්ති ජනගහනයෙන් 25 % ක ප්‍රමාණයක් ආවරණය කරන අතර අපගේ සමස්ත විදේශ ඉපැයීම් වලින් 60% වාර්ෂිකව සම්ප්‍රේෂණය කරති. අපගේ සංක්‍රමණික සේවක ප්‍රජාව සඳහා ආරක්ෂිත මෙන්ම ගෞරවාන්විත රැකියා අවස්ථා විදේශ රටවලදීත් හිමි වන බවට තහවුරු කිරීමට අපි බැදී සිටිමු. සියලු ප්‍රයත්න පසෙකලා, අපගේ ඇතැම් සංක්‍රමණික ශ්‍රමිකයන්හට අවාසනාවන්ත තත්වයන්ට මෙන්ම සේවා දුෂ්කරතා වලට මුහුණපෑමට සිදුවන බව එවන් අවස්ථාවලදී මාගේ අමාත්‍යාංශය, විදේශ රැකියා අමාත්‍යාංශය සමග එක්ව අපගේ ශ්‍රමිකයන්ගේ අභිලාෂයන් නියෝජනය කිරීමට හැකි උපරිමයෙන් කටයුතු කොට ඇති බවත් ප්‍රකාශ කළ යුතුය. මෙම වසරේ ගතවූ මාස 08 ක කාලය තුළදී මාගේ අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 181 ක මුදලක් එසේ ආපදාවන්ට පත් පුද්ගලයින් සහ එම පවුල් 187 ක් වෙත වන්දි වශයෙන් ලබාදීමට කටයුතු කොට ඇත.

සම්භාවනීය අමුත්තනි,

සුරක්ෂිත හා ක්‍රමවත් සංක්‍රමණය ගැන අවධාරණයෙන් කථා කරන අප සමාජයේ නීති විරෝධී මිනිස් ප්‍රවාහනයට හා බලහත්කාර මිනිස් ජාවාරමට ගොදුරු වන පුරවැසියෝද සිටිති. මෙම නීති විරෝධී හා අක්‍රමවත් සංක්‍රමණික කටයුතු හේතු කොට ගෙන වටිනා ජීවිත අවදානමට ලක්වේ. එහෙයින් මේ සම්බන්ධයෙන් දේශීය වශයෙන් දැඩි පියවර ගැනීම අපි ස්ථිර වශයෙන්ම අරමුණු කරගෙන සිටින්නෙමු. පසුගිය වර්ෂයේ ජූනි මාසයේදී ශ්‍රී ලංකාව පැලර්මෝර් සන්ධානයේ ප්‍රවාහණ සන්ධාන තහවුරු කළාය. මෙවැනි නීති විරෝධී මිනිස් ප්‍රවාහනය හා බලහත්කාර මිනිස් ජාවාරම සුදුසු ප්‍රතිපත්ති, රෙගුලාසි හා නීති රෙගුලාසි හැකියාවන් ප්‍රවර්ධනය කර ගැනීම වැදගත්වේ.

2014 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලුණු සංක්‍රමණිකයින්ගේ මානව හිමිකම් පිළිබද එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත විසින් සපයාදෙන ලද වැදගත් නිර්දේශ සනිටුහන් කරගෙන ඇත්තෙමු. ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ නායකත්වය යටතේ 2015 ජනවාරි මාසයේදී බලයට පැමිණි නව රජය විසින් අන්තර්ජාතික ප්‍රජාව සමග අපේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය පිළිබද නව ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. පසුගිය රජය විසින් අනුගමනය කළ ජාත්‍යන්තරව ස්වයං හුදෙකලාවීමේ ප්‍රතිපත්තිය වෙනස් කළ අපි සෙසු ජාතීන් සමග එක්ව කටයුතු කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරමු. දැනට අපි එක්සත් ජාතීන් හා මුළු මහත් ජාත්‍යන්තර ප්‍රජාව සමග අර්ථකාරී සංවාදයක නියැී සිටිමු. සංක්‍රමණික කටයුතු වැඩි දියුණු කිරීම ඇත්තවශයෙන්ම, උසස් ප්‍රජාතන්ත්‍රවාදය සංහිදියාව හා සංවර්ධනය පිළිබද අපේ උත්සාහයන් සාක්ෂාත් කරගැනීමෙහිලා සංක්‍රමණික කටයුතු වැඩි දියුණු කර ගැනීම ඉවහල් වනු ඇත.

ලබන සතියේදී ජිනීවාහිදී පැවැත්වෙන සංක්‍රමණික කම්කරුවන්ගේ අයිතිවාසිකම් පිළිබද ජාත්‍යන්තර සම්මුතියේ දෙවන වරට සමාලෝචනය කිරීම සදහා සහභාගී වන අපි මෙම ජාත්‍යන්තර ගිවිසුම තවදුරටත් සළකා බැලීම සම්බන්ධයෙන් අනුබල දෙමු.

අවසාන වශයෙන්, සාර්ථක අමාතය මණ්ඩලීය රැස්වීමක් කොලඹදී පැවැත්වීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් අතුකෝරළ අමාත්‍යතුමියට සහ සංවිධායකවරුන්ට ස්තූතිය පුද කර සිටින අතර මේ සම්බන්ධයෙන් ඔබ විසින් ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග සදහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ පූර්ණ සහයෝගය ලැබෙනු ඇති බවට ඉදුරා ප්‍රකාශ කරමි.